සැ. යු.—2009.08.21 දින පළවූ අංක 1,616 දරන ගැසට් පත්‍රයේ I- II(අ) සහ II කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,617 - 2009 අගෝස්තු මස 28 වැනි සිකුරාදා - 2009.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1182 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1185 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 සැප්තැම්බර් මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අගෝස්තු මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරිම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරිම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යත්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසංණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,

# තනතුරු – ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 සැප්තැම්බර් මස 25 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 06 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අයදුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | අයදුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| පුත්තලම | මහවැව | වලහපිටිය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ දකුණු පිටිගල් කෝරලේ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

08-588

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 සැප්තැම්බර් මස 25 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 06 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අයදුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | අයදුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කෑගල්ල | මාවනැල්ල | මැද පත්තුව කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ ගල්බඩ කෝරලේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

08-589

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 සැප්තැම්බර් මස 18 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජූලි මස 31 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | වලපනේ | යටිපළාත කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වලපනේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |
| එම | වලපනේ | උඩපළාත දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වලපනේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | -එම- |
| නුවරඑළිය | අඹගමුව | හැටන් දික්ඔය නගර කොට්ඨාසයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

08-590

---

## සංශෝධනයයි

### ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු බඳවා ගැනීම

අංක 1613 දරන 2009.07.31 දිනැති *ගැසට් නිවේදනයේ* 1 වැනි කොටස ඃ (IIඅ) වැනි ඡේදය - පලකිරීම් හි තනතුරු ඇබෑර්තු යටතේ පලවූ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු බඳවා ගැනීම සඳහා වන නිවේදනය පහත සඳහන් අයුරු සංශෝධනය කෙරේ.

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2009.08.21 ලෙස සංශෝධනය කරනු ලැබේ.

එස්. ඩී. ඒ. බී. බොරලැස්ස,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

08-686

---

### සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ උපදේශන සහකාර තනතුරු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම

සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ඇති ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත විස්තර දැක්වෙන පරිදි සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම තනතුරු සම්බන්ධයෙන් සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය;

(ii) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12දක්වා ඡේදවල විධිවිධාන ද අදාළ වේ.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල විධිවිධාන වලට හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

(iv) මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

(v) පත්වීම ලබා දෙන දිස්ත්‍රික්කය තුළ අවම වශයෙන් අවුරුදු 03 ක කාලයක් සේවය කල යුතුය.

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක, භාෂා මාධ්‍යය හා තනතුරු සංඛ්‍යාව පහත දැක්වේ.

| | | |
|---|---|---|
| යාපනය | - දෙමළ භාෂා මාධ්‍යය | - තනතුරු 02 යි |
| මඩකලපුව | - දෙමළ භාෂා මාධ්‍යය | - තනතුරු 01 යි |
| අනුරාධපුරය | - සිංහල භාෂා මාධ්‍යය | - තනතුරු 01 යි |
| පොළොන්නරුව | - සිංහල භාෂා මාධ්‍යය | - තනතුරු 01 යි |
| අම්පාර | - සිංහල භාෂා මාධ්‍යය | - තනතුරු 01 යි |

2. වැටුප් පරිමාණය :

මෙම තනතුරු සඳහා බඳවා ගන්නා උපාධිධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) අනුව එම්/එන්- 4-2006 -A වැටුප් පරිමාණය හිමි වේ.

රු. 15,215 - 10 x 215 - 4 x 240 - 7 x 320 - 15 x 360 - රු. 25,965

3. මූලික සුදුසුකම් :

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය;

(ii) 2009.09.31 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අයට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ).

4. අධ්‍යාපන සුදුසුකම් :

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් (මනෝවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය හෝ උපාධි පාඨමාලාවේ විෂයයක් වශයෙන් මනෝවිද්‍යාව හදාරා සමත්ව ඇති අයට ප්‍රමුඛතාවය හිමිවේ). සමග

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා සමත්වීම

හෝ

(ii) රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳව අවම වශයෙන් එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්වීම

5. *බඳවා ගැනීමේ ක්‍රමය.*—ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබාගන්නා ලකුණු ප්‍රමාණය මත ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් බඳවාගනු ලැබේ.

6. *අයදුම්කිරීමේ ක්‍රමය.*—පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරැදිව සම්පූර්ණ කර අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්වලට අදාල සහතිකපත්වල ඡායාස්ථ පිටපත් ද සමග 2009.09.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය, 5 වැනි මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය සහිතව අයදුම්කළ යුතුය. (තේරී පත්වුවහොත් මුදාහැරීම සඳහා එකඟවන බව දැන්විය යුතුය). ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "උපදේශන සහකාර තනතුරු සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් සහ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අසම්පූර්ණ ඉල්ලුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම නිවේදනයේ ආවරණය නොවන කරුණක් පිළිබඳව සහ බඳවා ගැනීම හෝ ඇබෑර්තු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම හෝ නොකරීම සම්බන්ධ අවසාන තීරණය සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් සතුය.

වී. ජෙගරාසසිංගම්,
ලේකම්,
සමාජසේවා හා සමාජ සුභසාධන
අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 10 වැනි දින,
5 වැනි මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

ආදර්ශ අයදුම්පත්‍රය

සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ උපදේශන සහකාර තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම

| අයදුම්කරන භාෂා මාධ්‍යය | |
|---|---|

1. මුලකුරු සමග නම :———. පූජ්‍ය/මයා/මිය/මෙනවිය
(Name with initial) Rev./Mr./Ms.
2. සම්පූර්ණ නම :———.
Full Name :———.
3. ස්ථිර ලිපිනය :———.
4. දැනට පදිංචි ලිපිනය :———.
5. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———.
6. ජාතික හැඳුනුම්පත් අංකය :———.
7. ස්ත්‍රී/පුරුෂ භාවය :———.
8. (i) උපන් දිනය : අවුරුද්ද :——. මාසය :——. දිනය :——.
(ii) 2009.09.30 දිනට වයස : අවුරුදු :——.මාස :——. දින :——.
9. ජාතිය :———.
10. විවාහක/අවිවාහක බව :———.
11. උපාධිය පිළිබඳ විස්තර :
(i) විශ්ව විද්‍යාලය :———.
(ii) උපාධිය පිරිනැමූ දිනය :———.
(iii) විශේෂවේදී/සාමාන්‍ය :———.
(iv) විෂයයන් :———.
(v) පන්තිය : පළමු/දෙවන පෙළ ඉහළ/දෙවන පෙළ පහළ :——.
(vi) භාෂා මාධ්‍යය :———.

12. අදාළ වන වෙනත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) ඒ පිළිබඳ විස්තර :

(i) ———.
(ii) ———.
(iii) ———.

13. භාෂා ප්‍රවීණත්වය (අදාළ තීරුවෙහි ✓ ලකුණ යොදන්න.)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | ......... | ......... | ......... | ......... |
| දෙමළ | ......... | ......... | ......... | ......... |
| ඉංග්‍රීසි | ......... | ......... | ......... | ......... |

14. පළපුරුද්ද :....................................................

**අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සහතිකය :**

............වන මම මෙහි සඳහන් කරන ලද සියළුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත සේවයෙන් විශ්‍රාම ගන්වා නොමැති බවත් තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරාගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත්කිරීමට හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

මෙම ඉල්ලුම්කරු වන....................... මහතා/මහත්මිය/මෙය., දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ................. වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :———.

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :———.

දිනය :———.

08-674

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2007 (2009)

පහත නම් සඳහන් රජයේ දෙපාර්තමේන්තුවල, එහි ඉදිරියෙන් දක්වා ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට අයත් පුරප්පාඩු තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙයට යා කර ඇති ආදර්ශ ආකෘතිය අනුව අංක 1 සිට 6 දක්වා මුල් පිටුවේ දැක්වෙන අයුරු අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයට පිළියෙල කරන ලද අයදුම්පත් 2009.09.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ, බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, "විභාග කොමසාරිස් ජනරාල් යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා වන විභාගය - 2007 (2009)" යනුවෙන් පැහැදිලිව දැක්විය යුතුය.

ඒ ඒ තනතුරු සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ යුතු අතර, තම ඉල්ලුම් පත්‍රයේ, මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අයදුම් කෙරෙන තනතුරු අනු පිළිවෙලින් සටහන් කළ යුතුය. නිදසුනක් වශයෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා සහකාර අධ්‍යක්ෂ, පර්යේෂණ නිලධාරි, ආදී තනතුරුවලට අයදුම් කිරීමට අපේක්ෂා කරන්නෙකු අදාළ තනතුරුවල සංකේත අංක 0077, 0078 ආදී වශයෙන් අයදුම්පත්‍රයේ "සංකේත අංකය" යන තීරුවේ දැක්විය යුතුය.

| | *දෙපාර්තමේන්තුව* | | *පුරප්පාඩු තනතුරු* | *සංකේත අංකය* |
|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 1 | සහකාර අධ්‍යක්ෂ | 0011 |
| 2. | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 2 | ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක | 0022 |
| 3. | වාරි මාර්ග දෙපාර්තමේන්තුව | 3 | සහකාර පස් රසඥ | 0033 |

| | *දෙපාර්තමේන්තුව* | | *පුරප්පාඩු තනතුරු* | *සංකේත අංකය* |
|---|---|---|---|---|
| 4. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 4 | සහකාර අධ්‍යක්ෂ | 0044 |
| 5. | කම්කරු දෙපාර්තමේන්තුව | 5 | පර්යේෂණ නිලධාරි | 0055 |
| 6. | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 6 | රසඥ හා ලෝහ විද්‍යාඥ | 0066 |
| 7. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 7 | සහකාර අධ්‍යක්ෂ | 0077 |
| | | 8 | පර්යේෂණ නිලධාරි | 0078 |
| 8. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 9 | සහකාර වන සංරක්ෂක | 0089 |
| 9. | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | 10 | සහකාර අධ්‍යක්ෂ | 0910 |
| 10. | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 11 | කාලගුණ විද්‍යාඥ | 1011 |

2. *සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා සේවා කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුයි. පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් වනු ඇත.

(iii) රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 509/7 සහ 1988 ජුනි මස 07 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධන ද යටතේ තෝරා ගනු ලබන අපේක්ෂකයකු, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(iv) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට ඉඩ ඇත.

3. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය* :

I වැනි පන්තිය - රු. 36,755 - 17 x 1,050 - රු. 53,555.
II වැනි පන්තිය - රු. 30,175 - 8 x 790 - රු. 35,705.
III වැනි පන්තිය - රු. 22,935 - 10 x 645 - රු. 29,385.

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි සඳහන් විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලබන අතර පත්වීමේ දින සිට වසර 03ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම සහ පත්වීමේ දින සිට වසර 06ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම ද රා. පරි. ච. 20/2001 අනුව සමත් විය යුතුවේ.)

*සටහන* :-

(i) පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම :

පහත සඳහන් විෂයයන් ඇතුළත් පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. :-
(අ) මූල්‍ය ක්‍රම;
(ආ) පරිපාලනය;
(ඇ) දෙපාර්තමේන්තු රෙගුලාසි.

(ii) දෙවැනි කාර්යක්ෂමතා කඩඉම :

අදාළ බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් අයුරු එම්. එස්. සී/එම්. ෆිල් හෝ පී. එච්. ඩී. වැනි පශ්චාත් උපාධියකින් සමත් විය යුතුය.

4. *තනතුරු සඳහා අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

4.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම;
4.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත වීම;
4.3 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර අයදුම්කරුවන් වයස අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි වීම. (මෙම නිවේදනයේ සඳහන් පරිදි අදාළ තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.);
4.4 පහත සඳහන් අදාළ අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට සපුරා තිබිය යුතුය:—

| *දෙපාර්තමේන්තුව* | *වෘත්තිය* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|
| 1. ජාතික සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව | 1. සහකාර අධ්‍යක්ෂ | (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් සත්ත්ව විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>(ආ) රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව හා උද්භිද විද්‍යාව යන විෂයයන් සහිතව (පළමුවැනි හෝ දෙවැනි පංතියේ) සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| 2. රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | 2. රජයේ සහකාර රස පරීක්ෂක | (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ පළවැනි පෙළ හෝ දෙවැනි පෙළ විශේෂ උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. උපාධිය ලබා තිබීම.<br>හෝ<br>(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව විෂයක් සහිතව මූලික උපාධියක් ලබා තිබීම සහ පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 3. සහකාර පස් රසඥ | (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රධාන හෝ උප විෂයයක් ලෙස කෘෂි රසායන විද්‍යාව හෝ රසායන විද්‍යාව සහිතව කෘෂිකර්මය හෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය.<br>හෝ<br>(ආ) රසායන විද්‍යාව හෝ කෘෂි විද්‍යාව විෂයක් වශයෙන් ඇතිව පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ විද්‍යා උපාධියක් දරන්නෙකු වීම. |
| 4. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 4. සහකාර අධ්‍යක්‍ෂ | (අ) ජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ විශේෂ විද්‍යා උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>(ආ) උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව අතිරේක විෂයක් වශයෙන් ඇතිව සත්ත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>(ඇ) සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව යන විෂයන්ගෙන් දෙකක් ඇතුළත්ව පළමුවැනි හෝ දෙවැනි පන්තියේ සාමාන්‍ය විද්‍යා උපාධියක් ලබා තිබීම<br>හෝ<br>(ඈ) වනජීවී සංරක්‍ෂණය හෝ වනජීවී කළමණාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර සංරක්‍ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>හෝ |

| | | |
|---|---|---|
| | | (ඉ) උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව අතිරේක විෂයක් වශයෙන් ඇතිව රසායන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| | | හෝ |
| | | (ඊ) ශාක විද්‍යාවන්, කෘෂි විද්‍යාවන්, පරිසර විද්‍යාව, ස්වභාවික සම්පත් යන විෂයයන් පිළිබඳ විශේෂ විද්‍යා උපාධියක් ලබා තිබීම. |
| | | හෝ |
| | | (උ) ඉහත විෂයන්ට අමතරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ඒ හා සමාන විෂයන්ගෙන් යුත් විශේෂ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 5. කම්කරු දෙපාර්තමේන්තුව | 5. පර්යේෂණ නිලධාරී | (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව පිළිබඳ පළමුවන හෝ දෙවන පෙළ විශේෂ උපාධියක් |
| | | හෝ |
| | | (ආ) ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ හෝ මහා බ්‍රිතාන්‍යයේ හෝ අයර්ලන්තයේ රසායන විද්‍යාව පිළිබඳ රාජකීය ආයතනයේ සාමාජිකත්වය |
| | | හෝ |
| | | (ඇ) රසායන විද්‍යාව, කාර්මික විෂ විද්‍යාව, කාර්මික ස්වස්ථතාව හෝ පරිසර සංශෝධිත ව්‍යවහාරික රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය. |
| 6. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 6. රසඥ හා ලෝහ විද්‍යාඥ | (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් අතිරේක විෂය වශයෙන් භෞතික විද්‍යාව හෝ ශුද්ධ ගණිතය හෝ සමග (භෞතික විද්‍යාවට වැඩි සැලකිල්ලක් දක්වයි.) රසායන විද්‍යාව විෂයයෙන් විශේෂ උපාධියක් ලබා තිබිය යුතුය |
| | | හෝ |
| | | (ආ) ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ හෝ සමාන පිළිගත් ආයතනයක උපාධි/වරලත් සාමාජිකත්වය ලබා තිබීම |
| | | හෝ |
| | | (ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ලෝහ විද්‍යාව හෝ ඛනිජ තෙල් රසායන විද්‍යාව හෝ රබර් තාක්ෂණ විද්‍යාව යන ක්ෂේත්‍රයන්ගෙන් එකකින් පශ්චාත් උපාධි සුදුසුකම් ලබා තිබීම. |
| 7. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6. සහකාර අධ්‍යක්ෂ | (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ උපාධියක් ලබා තිබීම |
| | | හෝ |
| | | (ආ) කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| | | හෝ |
| | | (ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උද්භිද විද්‍යාව හෝ ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ආර්ථික විද්‍යාව, ගණිතය, ජ්‍යාමිතිය, ජීව රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහිත පළමුවන හෝ දෙවන පන්තියේ විශේෂ විද්‍යා උපාධියක් ලබා තිබීම. |

| | | |
|---|---|---|
| 8. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 7. සහකාර වන සංරක්ෂක | (අ) උද්භිද විද්‍යාව විෂයයක් සහිතව හා සත්ත්ව විද්‍යාව හෝ රසායන විද්‍යාව අතිරේක විෂයයක් සහිතව; |
| | | හෝ |
| | | සත්ත්ව විද්‍යාව විෂයයක් සහිතව හා උද්භිද විද්‍යාව අතිරේක විෂයයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ විද්‍යා උපාධියක් |
| | | හෝ |
| | | (ආ) ජීව විද්‍යාව විෂයයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ හෝ විද්‍යා උපාධියක්; |
| | | හෝ |
| | | (ඇ) කෘෂිකර්මය පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ හෝ ගෞරව උපාධියක්; |
| | | හෝ |
| | | (ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් වන විද්‍යාව පිළිබඳව පළමුවන හෝ දෙවන පෙළ උපාධියක් |
| | | හෝ |
| | | (ඉ) වන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 9. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | 10. සහකාර අධ්‍යක්ෂ | (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 10. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 11. කාලගුණ විද්‍යාඥ | (අ) පිළිගත් විශ්වවිද්‍යාලයක භෞතික විද්‍යාව හෝ ගණිතය පිළිබඳව විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම; |
| | | හෝ |
| | | (ආ) පිළිගත් විශ්වවිද්‍යාලයක භෞතික විද්‍යාව සහ ගණිතය විෂයයක් සහිතව පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම; |
| | | හෝ |
| | | (ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක කාලගුණ විද්‍යාව හෝ භෞතික විද්‍යාව පිළිබඳ පී. එච්. ඩී. හෝ එම්. එස්. සී හෝ එම්. ෆිල් උපාධියක් ලබා තිබීම. |
| | | සටහන : |
| | | (i) භෞතික විද්‍යාව සහ ගණිතය විෂයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාවේදී උපාධියක් ලබා ඇති කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් ඇති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුස්සෝ වෙති. |
| | | (ii) අයැදුම්කරු ගණිතය විෂය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබේ නම්, ඔහු/ඇය තම සාමාන්‍ය විද්‍යා යෝග්‍යතා විභාගයේදී භෞතික විද්‍යාව විෂයයෙන් සමත් වී තිබිය යුතුය. |

සටහන :-

(i) සුදුසුකම් සම්බන්ධයෙන් වූ නිල සහතිකය හෝ එම සහතිකය වෙනුවට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් පිළිගන්නාවූ නිල ලේඛනයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කර ඇත්නම්, පමණක් විද්‍යාත්මක සේවයේ පත්වීමක් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් ලබා ඇති බැව් සලකනු ලැබේ. ඒ අනුව සෑම අයැදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5. පහත සඳහන් ලියවිලි අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන්ට නියම කෙරෙනු ඇත.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. බෞතිස්ම සහතික හෝ උපකෘත පාසල් පිළිබඳ ව්‍යවස්ථාවල කාර්යයන් නිකුත් කරන ලද උප්පැන්න සහතික භාර ගනු නොලැබේ.)
(ආ) උපාධි සහ උසස්ම අධ්‍යාපනික සහතික
(ඇ) චරිත සහතික දෙකක් - (මින් එකක් අධ්‍යාපන ආයතනයක අධ්‍යක්ෂක/කථිකාචාර්යවරයාගෙන් විශ්වවිද්‍යාල මහාචාර්යයවරයාගෙන් විය යුතුය)
(ඈ) වෘත්තීය පළපුරුද්ද හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික
(ඉ) සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික

6. (i) ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද 07 සිට 11 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය 3 වැනි පිටුවද වන ලෙස ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු අතර, ඉල්ලුම්පත්‍රය අත් අකුරෙන්ම පැහැදිලිවම පිරවිය යුතුයි. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූලද යන්න අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයැදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවලට සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කරන්න.

(ii) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් සඳහන් ඔබගේ ඉල්ලීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

7. විභාග ගාස්තු - විභාගය සඳහා ගාස්තුව රු. 300 කි. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකට ආදායම් ශීර්ෂ 4000-20-03-20-13ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබාගත් ලදුපත ඉල්ලුම් පත්‍රයෙහි අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය කොළඹ දී පවත්වනු ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

10. ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම පුද්ගලයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන නියමිත පරිදි සහතික කර, ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළයුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති රීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත.

සටහන :-

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට සාක්ෂියක් ලෙස නොසැලකිය යුතුය.

11. අපේක්ෂකයාගේ අනන්‍යතාව : තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුයි. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම් පත්‍රය,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය).

12. සාවද්‍ය තොරතුරු සැපයීම : අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. විභාග ක්‍රමය :- විභාග මාධ්‍යය (ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

(අ) විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් විභාගයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් ය. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ඇ) අපේක්ෂකයකු සුදුසුකම්ලත් විභාගයේ විෂයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම විභාගයේදී ඔහු සමත් වූ විෂයන්ගෙන් වැඩි ගණනකට යොදාගත් භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත් අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.

සටහන :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි "සුදුසුකම්ලත් විභාගය" යන පදයෙන් අදහස් කරන්නේ මූලික සුදුසුකම්ලත් විභාගය වේ.
(ii) අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය.
(iii) තම ඉල්ලුම්පතෙහි සඳහන් විභාග භාෂාව හෝ විෂයයන් හෝ ඒවායේ මට්ටම් හෝ වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.
(iv) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

15. *බඳවා ගැනීමේ ක්‍රමය* - (i) සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහකාර පස් රසඥ, කම්කරු දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි, සහකාර වන සංරක්ෂක හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ විද්‍යාඥ යන තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි ඔහු වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් මඟින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල මත පමණක් බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂකයන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

(ii) රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර රස පරීක්ෂක තනතුර, දුම්රිය දෙපාර්තමේන්තුවේ රසඥ හා ලෝහ විද්‍යාඥ තනතුර, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ හා පර්යේෂණ නිලධාරි තනතුර සඳහා ඉහත දක්වා ඇති පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත සකස් කරන ලද කුසලතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගනු ලැබේ.

(අ) බුද්ධි පරීක්ෂණය - ලකුණු 100 යි - පැය 1 ක ප්‍රශ්න පත්‍රයකි.
(ආ) පොදු ප්‍රශ්න පත්‍රය - ලකුණු 100 යි - පැය 3ක ප්‍රශ්න පත්‍රයකි.

16. නිර්දේශ පත්‍රිකා :

බුද්ධි පරීක්ෂණය - පැය 01 ක කාලයකට සීමාවන මෙය, සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ තත්ත්වයත් ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැලපෙන ප්‍රශ්නවලින් යුක්ත වනු ඇත.

*පොදු ප්‍රශ්නපත්‍රය* - මෙය කොටස් දෙකකින් යුක්ත ය.

i *වන කොටස* - සියලුම විෂයයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ව්‍යුහගත ප්‍රශ්නවලින් යුක්ත වේ.

ii *වන කොටස* - ආර්ථික දේශපාලන සහ කලාව වැනි අනෙකුත් සාමාන්‍ය විෂයයන් සම්බන්ධයෙන් ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත වේ.

17. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

18. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2009 ජූලි මස 17 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය.
කොළඹ 07.

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විවෘත තරග විභාගය**

***II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම - 2007 (2009)***

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

[ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්කරන තනතුර/තනතුරු :

| *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සංකේත අංකය* |
|---|---|---|
| | | |

01. ඉල්ලුම්කරුගේ නම :————.

1.01 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න) :————.

1.02 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.03 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කරන්න) :————.

02. ලිපිනය :————.

2.01 ප්‍රවේශපතක් එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්) :————.

2.02 රාජකාරී ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ

පුරුෂ - 0

ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. වයස :———.

5.01 උපන් දිනය : වර්ෂය මාසය දිනය

5.02 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ

අවුරුදු මාස දින

06. විවාහක/අවිවාහක බව :

අවිවාහක - 1 / විවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. සුදුසුකම්

7.01 අධ්‍යාපන සුදුසුකම් ඃ

සමත් වූ විභාගය/උපාධිය, පන්තිය, විෂයන් සහ විශ්ව විද්‍යාල/ආයතන සඳහන් කරන්න.

| *විභාගය/උපාධිය* | *පන්තිය* | *වර්ෂය* | *විෂයන්* | *විශ්ව විද්‍යාල/ ආයතන* |
|---|---|---|---|---|
| | | | | |

7.02 වෘත්තීය සුදුසුකම් :———.

08. සාමාර්ථය ලබා ඇති උසස්ම විභාගය

1. සිංහල :———.
2. දෙමළ :———.
3. ඉංග්‍රීසි :———.

09. පාසලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ ලැබූ පුහුණුව පිළිබඳ විස්තර (සේවය භාර ගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය) :———.

10. දැනට දරන තනතුරේ විස්තර :

(අ) තනතුර :———.
(ආ) දෙපාර්තමේන්තුව/ආයතනය :———.
(ඇ) පත්වීමේ දිනය :———.
(ඈ) ස්ථිර/විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත/තාවකාලිකද යන වග :———.
(ඉ) තනතුර ස්ථිර කර තිබේද යන වග :———.
(ඊ) තනතුරේ වැටුප් පරිමාණය සහ දැනට ලබන වැටුප :———.

11. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. :———.

12. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මනා ලෙස අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් තමන් වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

කුවිතාන්සි අංකය :———.

ගෙවන ලද කාර්යාලය :———.

දිනය :———.

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය බව ද, නිවැරදි බව ද මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වන බවද විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් පනවනු ලබන ඇති සියළුම නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

———.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

**ඉල්ලුම්කරු රජයේ සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව**

ඉහත 12 වැනි ඡේදයේ දී ඇති විස්තර නිවැරදි බවත්/පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම ..................... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

———.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

තනතුර :———.

දිනය :———.

08-557

**වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඕරුගොඩවත්ත**

***2010 වසර සඳහා ආධුනිකයින් බඳවා ගැනීම***

ජපන් රජයේ ආධාර මත වැල්ලම්පිටිය ඕරුගොඩවත්තේ පිහිටුවා ඇති මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ 2010 වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුහුණු කරනු ලබන වෘත්තීන් ඃ

| | *වෘත්තිය* | *කාලය* |
|---|---|---|
| 1.1 | මෝටර් රථ කාර්මික ශිල්පී<br>Automobile Mechanic | අවු. 03 |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>Automobile Electrician | අවු. 03 |
| 1.3 | යන්ත්‍ර ශිල්පී<br>Machinist | අවු. 03 |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ යාන්ත්‍රික ශිල්පී<br>Automobile A/C Mechanic | අවු. 02 |
| 1.5 | මෝටර් රථ ටින්කර් ශිල්පී<br>Automobile Tinker | අවු. 1 1/2 |
| 1.6 | මෝටර් රථ පින්තාරු ශිල්පී<br>Automobile Painter | අවු 1 1/2 |

2. ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඃ-

2.1 1.1 සිට 1.4 දක්වා වෘත්තීන් සඳහා—

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ (මාධ්‍ය භාෂාව), ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. තව ද ගණිතය I, II සහ විද්‍යාව, I, II සමත් අයදුම්කරුවන් එය පැහැදිලිව වෙන් වෙන් වශයෙන් අයදුම්පතෙහි සඳහන් කළ යුතු වේ.

2.2 අංක 1.5 සිට 1.6 දක්වා වෘත්තීන් සඳහා—

රජයේ ආධාර ලබන හෝ අනුමත කරන ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් විය යුතුවේ.

3. වයසඃ-

2010.01.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු 25ට නොවැඩි විය යුතුයි.

4. පුහුණුව පිළිබඳ විස්තරඃ-

4.1 වෘත්තීය පුහුණුව ද්විත්ව ක්‍රමය මත සැලසුම් කර ඇත.
1.1 සිට 1.4 වෘත්තීය පුහුණුවේ පළමු වසරේ මූලික පුහුණුව ආයතනය තුළ දී ලබා දේ.
පුහුණුවේ දෙවන හා තුන්වන වසර වැඩිදුර පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන ප්‍රධාන කර්මාන්ත ශාලා වලට අනුයුක්ත කරනු ලැබේ.

4.2 1.5 සහ 1.6 දක්වා වෘත්තීන් සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනය තුළදී මූලික පුහුණුව ලබාදෙන අතර, ඉතිරි වසර උක්ත 4.1 ආකාරයෙන් කර්මාන්ත ශාලාවල පුහුණුව ලබාදේ.

4.3 උක්ත සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් වර්ධනය වී ඇත.
විශේෂයෙන්ම 1.5 හා 1.6 වෘත්තීන් දෙක සඳහා දේශීය හා විදේශීය රැකියා සඳහා ඉල්ලුම වැඩි වී ඇත.

4.4 යන්ත්‍ර ශිල්පී වෘත්තිය සඳහා මූලික යන්ත්‍ර පුහුණුවට අමතරව හෙඩ් ෆේසින්, බෝරිං, හොනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් සහ ටූල් සහ කටර් ග්‍රයින්ඩින් යන සියළුම යන්ත්‍රවල පුහුණුව ඇතුළත්ය.

4.5 සියළුම පාඨමාලා "ජාතික වෘත්තීය සුදුසුකම" (NVQ) ඉලක්ක කර ගත් නිපුනතා පාදක පුහුණු ක්‍රමය (CBT) මත පවත්වා ගෙන යනු ලැබේ.

5. දීමනා හා වෙනත් ප්‍රතිලාභ :-

* ආයතනයේ පුහුණුවන කාලය තුළදී මාසික ආධුනිකත්ව දීමනාවක් හා පුහුණුව සඳහා මසා නිමකළ නිල ඇඳුමක් (Overall) ද ලබා දෙනු ලැබේ.

* සීමිත සිසුන් සංඛ්‍යාවකට ශිෂ්‍යාධාර ලබාදීමේ ක්‍රමයක් ද පිහිටුවා ඇත.

* පුහුණුවට බඳවා ගන්නා සියළුම ආධුනිකයින්ට ඉංග්‍රීසි භාෂාව හා පරිඝනක දැනුම ලබා දෙනු ලැබේ.
සියළුම ආධුනිකයින් සඳහා අදාළ පුහුණු කාලය තුළ දී රක්ෂණ ආවරණයක් ලබා දෙනු ඇත.

6. ආධුනිකත්ව ගිවිසුම :-

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයකු විසින්ම ආධුනිකයා සහ සේවා යෝජකයා යන දෙදෙනා වෙත අන්‍යෝන්‍ය වගකීම පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුලත් විය යුතුයි.

6.2 පාඨමාලාවෙහි මුල් මාස 06 ආධුනිකයාගේ පරිවාස කාලය ලෙස සැලකේ. අනෙකුත් විනය නීති අනුව සතුටුදායක ලෙස පරිවාස කාලය අවසන් කිරීමට අපොහොසත් වුවහොත් එම ආධුනිකයින්ගේ ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

7. සහතික ලබාදීම :-

7.1 සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන ආධුනිකයින්ට “4 වැනි මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය” ප්‍රදානය කරනු ලැබේ. මෙම සහතිකය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති අතර, ජාත්‍යන්තරව පිළිගන්නා සහතිකයකි.

8. තෝරා ගැනීම :-

8.1 මූලික සුදුසුකම් සපුරන සියළුම අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එම පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනයකර ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය මත බඳවා ගනු ලැබේ.

9. අයදුම්පත් එවිය යුතු ආකාරය :-

9.1 අයදුම්පත් පහත දක්වා ඇති ආකෘතිය අනුව මි. මී. 290 x මි. මී. 210 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර 2009 සැප්තැම්බර් මස 11 දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

අධ්‍යක්ෂ/විදුහල්පති,
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය,
අංක 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
ඕරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

9.2 එක් අයදුම්කරුවෙකුට තමාගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය අනුව වෘත්තීන් තුනක් ඉල්ලුම් කළ හැකිය. එය පැහැදිළිව අයදුම්පතේ 10 වැනි ඡේදයේ සඳහන් කළ යුතුය.

9.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පුහුණුවක් දැනට ලබමින් සිටින අයට මේ සඳහා අයදුම් කළ නොහැක.

9.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ “ආධුනිකයින් බඳවා ගැනීම 2010” යනුවෙන් සඳහන් කළ යුතුයි.

9.5 තැපෑලේ දී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

අමල් සේනාලංකාධිකාර,
සභාපති.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය,
අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

*ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම් පත්‍රය - 2010 වර්ෂය සඳහා*

01. මුලකුරු සමග නම :

03.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

02. සම්පූර්ණ නම :

| 04. උපන් දිනය | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ලිපිනය :

දුරකථන අංකය :

07. පරිපාලන දිස්ත්‍රික්කය :

ප්‍රාදේශීය උපදිසාපති කොට්ඨාසය :

08. අධ්‍යාපන සුදුසුකම් : (ලබා ඇති උසස්ම සුදුසුකම් X ලකුණින්)

| | |
|---|---|
| 8 වන ශ්‍රේණිය | අ. පො. ස. (සා. පෙ.) |

09. අ. පො. ස (සා. පෙ.) විභාගයේ ප්‍රතිඵල :

| සමත්වූ විෂයයන් | ශ්‍රේණිය | වර්ෂය | සමත්වූ විෂයයන් | ශ්‍රේණිය | වර්ෂය |
|---|---|---|---|---|---|
| 1. ..................... | ......... | ......... | 7. ..................... | ......... | ......... |
| 2. ..................... | ......... | ......... | 8. ..................... | ......... | ......... |
| 3. ..................... | ......... | ......... | 9. ..................... | ......... | ......... |
| 4. ..................... | ......... | ......... | 10. ..................... | ......... | ......... |
| 5. ..................... | ......... | ......... | 11. ..................... | ......... | ......... |
| 6. ..................... | ......... | ......... | 12. ..................... | ......... | ......... |

අ. පො. ස. (උ. පෙ.) විභාගයේ ප්‍රතිඵල :

| සමත්වූ විෂයයන් | ශ්‍රේණිය | වර්ෂය | සමත්වූ විෂයයන් | ශ්‍රේණිය | වර්ෂය |
|---|---|---|---|---|---|
| 1. ..................... | ......... | ......... | 3. ..................... | ......... | ......... |
| 2. ..................... | ......... | ......... | 4. ..................... | ......... | ......... |

10. තමා පුහුණුව ලැබීමට කැමති වෘත්තීන් අනුපිළිවෙලින් :

| |
|---|
| 1. |
| 2. |
| 3. |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත්, මම ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය යටතේ පුහුණුවක් දැනට නොලබන බවත්, මෙයින් සහතික කරමි. ඉහත සඳහන් කරුණු අසත්‍ය බව අනාවරණය වුවහොත් මම ආධුනිකත්ව පුහුණුව ලැබීමට නුසුදුස්සකු වන බව ද හොඳින් දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය
අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

08-606

---

## ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2009 සැප්තැම්බර්

1991 මැයි මස 17 වැනි දින හා අංක 662/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර සමත්විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2009 සැප්තැම්බර් මස 27 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාල සටහන ප්‍රවේශපත්‍රයේ සඳහන් කරනු ඇත.

02. සුදුසුකම් :

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් හා දන්තශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් මෙතෙක් අදාල විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

03. අයදුම්පත් :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, "කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, "සුවසිරිපාය" ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග)" වෙත 2009 සැප්තැම්බර් මස 11 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග ලිපිනය ලියන ලද රු. 30 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක්ද එවිය යුතුය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාග ගාස්තු :

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.
(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

05. විභාගයට ඇතුළත්කර ගැනීම :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත්කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගල හැඳුනුම්පත්‍රය,
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය,
(ඇ) රියදුරු බලපත්‍රය,
(ඈ) ගමන් බලපත්‍රය.

(iii) කිසියම් නොවැලැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකිය. එසේ ඔබේ නමට අදාල විභාග අංකය සහ විභාග මධ්‍යස්ථානය සොයාගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිළධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක් ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරුකර විභාගයට පෙනී සිටිය හැකිය. (වෙබ් අඩවිය - www.health.gov.lk

06. විභාග පටිපාටිය :

මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබාගත යුතුය. එක් වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිළධාරින් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ අදාල සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතුය.

07. විභාග නිර්දේශ මාලාව :

07.1 ලිඛිත විභාගය

07.1.1 ආයතන සංග්‍රහය

කාලය පය 02 යි. ප්‍රශ්න 08කින් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

විෂය නිර්දේශය —

(i) ආයතන සංග්‍රහය

(අ) I කොටස - II, III, V, VI, VII, VIII, IX, XI, XII, XIII, XV, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේද

(ආ) II කොටස - XLVII සහ XLVIII වැනි පරිච්ඡේද

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රෙගුලාසි.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්යභාරය.

7.1.2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය

කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතු ය. මුළු ලකුණු 100 කි.

විෂය නිර්දේශය—

සෞඛ්‍ය සේවා සංග්‍රහය

I වැනි කොටස - වෛද්‍ය සේවා
II වැනි කොටස - රසායනාගාර සේවා

7.1.3 ගිණුම්

කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතු ය. මුළු ලකුණු 100 කි.

විෂය නිර්දේශය

(i) මුදල් රෙගුලාසි - I වැනි කොටස

| | | | |
|---|---|---|---|
| පරිච්ඡේද | I | - | සියළුම වගන්ති |
| | II | - | සියළුම වගන්ති |
| | III | - | සියළුම වගන්ති |
| | IV | - | සියළුම වගන්ති |
| | V | - | 1, 2, 3, 4, සහ 6 වගන්ති |
| | VI | - | සියළුම වගන්ති |
| | VII | - | 1, 2, 3, 4 සහ 6 වගන්ති |

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් තැබීම පිළිබඳ රෙගුලාසි.
(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ මුදල් පිළිබඳ ඡේදයන්.
(iv) සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියෙකුගේ දෛනික රාජකාරීවලට අදාල වන මුදල් රෙගුලාසි.

7.2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිළධාරීන් විසින් කොළඹ දී පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. මුළු ලකුණු 100 කි. තමන්ගේ සාමාන්‍ය රාජකාරී කටයුතු කරගෙන යාමේදී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහලෙන් හෝ දෙමළෙන් සාකච්ඡා කිරීමට නිළධාරීන්ට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයේ නියුතු අදාල නිළධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත. (2009 මාර්තු මස පැවැති විභාගයේ ප්‍රතිඵල අගෝස්තු මස 15 වැනි දිනට පෙර නිකුත් කිරීමට නියමිතය).

අයි. ටී. වීරසිංහ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 2
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

2009 අගෝස්තු මස 12 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

| | |
|---|---|
| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි. | |

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරීන් සඳහා වන**
**දෙපාර්තමේන්තු විභාගය - 2009 සැප්තැම්බර්**

01. (අ) (i) අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන් මුලකුරු අගට යොදා ලියන්න) :———.

(ii) අයදුම්කරුගේ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්, මුලකුරු අගට යොදා ලියන්න)

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) :———.

(iv) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) (i) නිල නාමය (වෛද්‍ය නිළධාරි/දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරි) :———.
(ii) සීමාවාසික පත්වීම ලද දිනය :———.
(iii) ප්‍රාථමික ශ්‍රේණියට පත්වීම ලද දිනය :———.

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (x) ලකුණ යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | | රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය | | ගිණුම් | |
| සිංහල වාචික | | දෙමළ වාචික | | | |

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :———.

04. (අ) දැන් සේවය කරන ආයතනය :———.

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :———.

(ඇ) ඔබට විභාගයට පෙනී සිටීමට හැකි ආසන්නතම හෙද විද්‍යාලය :———.

(ඈ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානයට අදාල කොටුවේ හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ, දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර, එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | | අම්පාර | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | | | |
| කුරුණෑගල | | අනුරාධපුරය | | රත්නපුරය | | | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | | | |

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"x 4" ප්‍රමාණයේ රු. 30.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :———.

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :———.

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද? :———.

(ආ) ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේ ද? :———.

| මුද්දර කොටුව |
|---|

06. අයදුම්කරුගේ සහතිකය;

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(i) මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ප්‍රථම වතාවට නොවන බැවින් රු. ……… ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම ඉල්ලුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳව ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

——.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

................................. මහතා/මිය/මෙනවිය* මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිළධාරියෙකු වන අතර, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට/ප්‍රථම වතාවට නොවන* බවට ද රු. ......... ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද* මා ඉදිරිපිට දී අත්සන් කළ බවද සහතික කරමි.

———.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :———.

**විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර* ප්‍රධානියාගේ සහතිකය**

................................. මහතා/මිය/මෙනවිය* වෛද්‍ය නිළධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරියෙකු* වශයෙන් මගේ කොට්ඨාසයේ/ව්‍යාපාරයේ* සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

———.
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(මුද්‍රාව තැබිය යුතුය)

දිනය :———.

(* අනවශ්‍ය කොටස් කපා හරින්න.)

08-660

---

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ නිලධාරීන් I වැනි පන්තියට උසස් කිරීමේ විභාගය - 2009

1.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ නිලධාරීන් එම සේවාවෙහි I වන පන්තියට උසස් කිරීමේ යෝග්‍යතා පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම විභාග කොමසාරිස් ජනරාල් විසින් 2009 දෙසැම්බර් මස දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ නිලධාරීන් එම සේවාවෙහි I වැනි පන්තියට උසස් කිරීම සඳහා වන මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය නගරවලදී පැවැත්වේ. නගර හා අදාළ නගර අංක පහතින් දැක්වේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුර | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුර | 13 |
| කිලිනොච්චිය | 14 |

ඉහත යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කෙරෙනු ඇත. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. අපේක්ෂකයකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම පිණිස පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.—

(i) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ වසර දහයක (10) සක්‍රීය සේවා කාලයක් හා එදිනට වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම,

(ii) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වැනි පන්තියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වී තිබීම.

*සටහන* - මෙම විභාගය පවත්වන දිනය පරීක්ෂණයෙන් සමත් වූ අපේක්ෂකයකු සේවයේ I වන පන්තියට උසස් කිරීමට සුදුසුකම් ලැබූ දිනය ලෙස සළකනු ලැබේ. ඉහත සඳහන් සුදුසුකම් නොමැතිව විභාගයට පෙනී සිට ඉන් සමත් වන නිලධාරීන් - I වන පන්තියට උසස් වීමක් ලැබීමට නුසුදුසු සේ සළකනු ලැබේ.

5.0 *විභාග පරිපාටිය* : අපේක්ෂකයන් පහත සඳහන් විෂයයන් ඇතුළත් ලිඛිත යෝග්‍යතා විභාගයකට පෙනී සිටිය යුතු ය.

| | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01. | ආයතන කාර්ය පරිපාටිය | 100 යි | පැය 1 1/2 යි |
| 02. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100 යි | පැය 1 1/2 යි |
| 03. | සිද්ධි අධ්‍යයනය | 100 යි | පැය 1 යි |
| 04. | පොදු ප්‍රශ්න පත්‍රය | 100 යි | පැය 1 යි |
| | එකතුව | 400 යි | |

*ආයතන කාර්ය පරිපාටිය* : ආයතන සංග්‍රහයේ I වන සහ II කාණ්ඩවල අඩංගු කරුණු පිළිබඳ ප්‍රායෝගික දැනුමක් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 08 (ලකුණු 25 යි)
II වන කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 04 කින් ප්‍රශ්න 03ට පිළිතුරු සැපයිය යුතු වේ. (ලකුණු 75 යි).

*රාජ්‍ය මූල්‍ය කළමනාකරණය* :

(අ) මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රායෝගික දැනුම,
(ආ) විගණනය පිළිබඳ මූලික දැනුම,
(ඇ) මූලික බැංකු පරිචය,
(ඈ) ගබඩාකරණය පිළිබඳ මූලික දැනුම,
පිළිබඳ පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්න පත්‍රයේ අරමුණ වන අතර මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

I වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 08 (ලකුණු 25 යි).
II වන කොටස - අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 04 කින් ප්‍රශ්න 03ට පිළිතුරු සැපයිය යුතු වේ. (ලකුණු 75 යි).

*සිද්ධි අධ්‍යයනය* : කාර්යාල පරිපාලනයට අදාළ වන ගැටලුවකට ගතයුතු ක්‍රියාමාර්ග විභාග වන පරිදි බහුවරණ, කෙටි පිළිතුරු හා අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතු වේ. අධ්‍යයනය සඳහා සිද්ධීන් සපයනු ලබන අතර පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න පහත පරිදි වේ.

I වන කොටස - බහුවරණ ප්‍රශ්න 05 යි (ලකුණු 05 යි)
II වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 05 යි (ලකුණු 05 යි)
III වන කොටස - අර්ධ ව්‍යුහගත ආකාරයේ ප්‍රශ්න 05 යි (ලකුණු 90 යි)

*පොදු ප්‍රශ්න පත්‍රය* : දේශීය හා විදේශීය කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ.

I වන කොටස - බහුවරණ ප්‍රශ්න 32 යි (ලකුණු 16 යි),
II වන කොටස - දෙනු ලබන මාතෘකා 04 න් 02 ක් සඳහා කෙටි සටහන් ලිවිය යුතු වේ. (ලකුණු 36 යි),
III වන කොටස - දෙනු ලබන රචනා ආකාරයේ ප්‍රශ්න 04 අතුරෙන් ප්‍රශ්න 02ක් සඳහා පිළිතුරු සැපයිය යුතු වේ. (ලකුණු 48 යි)

*සටහන* :-

(i) අපේක්ෂකයින් තමන් සේවයට ඇතුළු වූ භාෂා මාධ්‍යය හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් මෙම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතු ය.

(ii) මෙම විභාගයෙන් සමත්වීම සඳහා එක් එක් විෂයයෙන් අවම වශයෙන් ලකුණු සියයට 40ක් (40%) සහ මුළු ලකුණු 160 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය.

6.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන අතර විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරනු ඇත.

7.0 ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතු අතර ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2009 සැප්තැම්බර් මස 28 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ අයදුම්පත් යවන විට සතුටුදායක සේවය පිළිබඳ සහතිකයකුත් ඊට ඇතුළත් කළ යුතුය. සෑම අයදුම්පතක්ම සර්වප්‍රකාරයෙන්ම නිවැරදි ලෙස සම්පූර්ණ කර ඇති බවට හා සේවා සහතිකය තමන් විසින් අත්සන් කොට ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් වගබලාගත යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

8.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* : අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අනන්‍යතාව විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

9.0 *අයදුම්පත්‍ර* - අංක 1.1 සිට 1.9 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත්‍රය පිළයෙළ කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුවද එය නිවැරදි හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල හෝ දෙමළ හෝ බසට අමතරව ඉංග්‍රීසි බසින්ද සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව

ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරින් විසින් විභාගයට පෙනී සිටින්නේ නම් රු. 90 ක් වටිනා මුද්දර අයදුම්පත්‍රයේ අලවා තම අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළයුතුය. මොනම කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

නිසිලෙස අයදුම්පත් සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එම අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහන සහ මුද්‍රිත ප්‍රවේශපත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියළුම අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙළ කල යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතුය.

12.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 12 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය :

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ නිලධාරින් I වන පන්තියට උසස් කිරීමේ විභාගය - 2009

Examination for Promotion of Officers in Class II of Public Management Assistants' Service to Class I - 2009

| නගරය | නගර අංකය |
|---|---|
| | |

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

(ගැසට් නිවේදනයේ 2.0 ඡේදය අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ SUNIL, A. B.

1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
(සිංහලෙන්/දෙමළෙන්)

1.5 ඔබ රාජ්‍ය සේවයට ඇතුළු වූවාට පසුව ඔබේ නම වෙනස් කර තිබේද ? :———.
එසේ නම් මුල් නම සඳහන් කරන්න. :———.

1.6 සේවා ස්ථානය හා ලිපිනය :———.

1.6.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :———. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.6.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :———.
(සිංහලෙන්/දෙමළෙන්)

1.7 ස්ත්‍රී/පුරුෂ භාවය :———.

ස්ත්‍රී - 1
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.8 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

1.9 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

2.0 දැනට දරන තනතුර :

2.1 තනතුර :———.

2.2 පත්වීම් ලිපියේ අංකය සහ දිනය :———.

2.3 එම සේවයේ II වන පන්තියේ නිලධාරියකු වශයෙන් පත්වීම ලද දිනය :———.

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

2.4 සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක ඔබ උපයා ගෙන තිබේ ද? :———.
එසේ නොමැති නම් විස්තර සඳහන් කරන්න. :———.

2.5 ඔබ මොනයම් ආකාරයක හෝ දඬුවමක්/දඬුවම් ලබා ඇත්නම් ඒ පිළිබඳ කෙටි විස්තරයක් සඳහන් කරන්න. :———.

2.6 සංස්ථාවක හෝ වෙන් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා ඔබ දැනට මුදා හැර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :———.

2.7 ඔබ විදේශ රැකියාවක් සඳහා හෝ වෙනත් කාර්යයන් සඳහා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර :———.

3.0 3.1ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :———.

3.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් අලවන ලද මුද්දරවල වටිනාකම :———.

3.3 මුද්දර කොටුව :———.

| |
|---|
| ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් රුපියල් 90 ක් වටිනා මුද්දර මෙහි අලවන්න. |

4.0 අයදුම්කරුගේ ප්‍රකාශය :—

(i) ඉහත මා විසින් කරන ලද ප්‍රකාශයන් මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවත්;

(ii) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ නිලධාරියකු බවත් ......... දින මා රාජ්‍ය කළමාකරණ සහකාර සේවයේ II වන පන්තියට පත්වීම් ලද බවත්;

(iii) 2009 සැප්තැම්බර් මස 28 දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ අවුරුදු 10ක සක්‍රීය සේවා කාලයක් සහ එදිනට වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්;

(iv) මා ප්‍රථම වතාවට විභාගයට පෙනී සිටින බවත්/විභාග ගාස්තු සඳහා වන නියමිත වටිනාකමින් යුත් මුද්දර මෙහි අලවා ඇති බවත්, ගෞරවයෙන් සහතික කරමි.

මෙහි අඩංගු යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ අනාවරණය වුවහොත් මට විරුද්ධව විනායානුකූලව ක්‍රියා කරන බැව් දැන සිටිමි. තව ද විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

———.
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන
(පහත දැක්වෙන සටහන බලන්න)

දිනය :———.

සටහන 1. : රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට පෙර දරන ලද සාමාන්‍ය ලිපිකාර සේවය හෝ සමාන්තර සේවාවන්හි II/II "අ" පන්තියේ සේවා කාලය රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ සේවා කාලය ගණනය කිරීමේ දී අදාළ කර ගත යුතුය.

2. දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ......... මහතා/මහත්මිය/මෙනෙවිය ......... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

———.
සහතික කරන්නාගේ අත්සන
සහ නිල මුද්‍රාව

නම :———.

පදවි නාමය :———.

ලිපිනය :———.

දිනය :———.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ................. මහතා/මහත්මිය/මෙනෙවිය 2009 ......... මස ......... දිනට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ වසර දහයක (10) සේවය සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු බවත් ......... දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නිවේදනය ප්‍රකාරව මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු බවත්,

(ii) ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව පරිදි II වන පන්තියේ පත්වීම් ලිපියේ අංකය ......... (පත්වීම් ලිපියේ අංකය යොදන්න) බව ද,

(iii) ඔහු/ඇය මෙම අයදුම්පත්‍රයේ 1.0 සිට 4.0 තෙක් වන ඡේදයන්හි සඳහන් කර ඇති විස්තර නිවැරදි දැයි පරීක්ෂා කර බැලූ බව ද, ඒවා නිවැරදි බව ද,

(iv) ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බව ද/විභාගය සඳහා අදාළ වන නියමිත මුද්දර මෙහි අලවා ඇති බව ද මම සහතික කරමි.

(අනවශ්‍ය දෑ කපා හරින්න)

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

නම :———.

පදවි නාමය :———.

ලිපිනය :———.

දිනය :———.

08-687

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.